*සැ. යු.–* 2007.02.15 දින පළවූ අංක 1,485 දරණ *ගැසට් පත්‍රයේ* IV (අ) සහ II කොටස කොටස පළ නොකරන ලදී.
මෙවර පළවන *ගැසට් පත්‍රයේ* **V** කොටසේ 2001 වර්ෂයේ මුද්‍රිත පොත් නාමාවලියේ අප්‍රේල්- ජුනි කාර්තුව ඉංග්‍රීසි භාෂාවෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,486 - 2007 පෙබරවාරි 23 වැනි සිකුරාදා - 2007.02.23**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ජෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | – | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 145 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 144 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 146 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 මාර්තු මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 පෙබරවාරි මස 15 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# බඩු බාහිරාදිය විකිණීම්

## පොලිස් දෙපාර්තමේන්තුව

### අබලි භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

මීගමුව පොලිස් කොට්ඨාසයේ පොලිස් ස්ථාන වල පාවිච්චියෙන් ඉවත් කරනු ලැබූ පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2007 මාර්තු මස 01 වැනි දින පෙ. ව. 09.30 ට මීගමුව පොලිස් අධිකාරී කාර්යාලයේ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

අදාල භාණ්ඩ පරීක්ෂා කර බැලීම, 2007 පෙබරවාරි මස 28 වන දින ප.ව. 1.00 සිට ප .ව. 16.00 දක්වා මීගමුව පොලිස් අධිකාරී කාර්යාලයේ දී පරීක්ෂා කළ හැක. වෙන්දේසි භූමියට ඇතුල්වීමේ දී සියලුම තරාතිරමේ පුද්ගයින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

වෙන්දේසියෙන් ලබා ගන්නා භාණ්ඩ සඳහා එවේලේම මුදල් ගෙවා රිසිට් පතක් ලබාගත යුතු අතර එම භාණ්ඩ එදින පෙ.ව. 4.30 ට පෙර වෙන්දේසි භූමියෙන් ඉවත් කර ගත යුතුයි. එසේ ඉවත් කර නොගන්නා භාණ්ඩ පිළිබඳ වග කියනු නොලැබේ.

වෙන්දේසියෙන් භාණ්ඩ ඉදිරිපත් කිරීම, වෙන්දේසියෙන් භාණ්ඩ ඉවත් කර ගැනීම, යන සියලුම තීරණ ගැනීමේ බලය වෙන්දේසිකරු සතුවන අතර වෙන්දේසිකරුගේ තීරණය අවසන් තීරණය වේ.

### භාණ්ඩ ලැයිස්තුව

| | | |
|---|---|---|
| 01. | ඉමර්ජන්සි ලයිට් | 01 යි |
| 02. | කුඩා ගෑස් ලිප් | 01 යි |
| 03. | විදුලි ස්ත්‍රික්ක | 02 යි |
| 04. | සිවිලිත් පෑන් | 13 යි |
| 05. | ඇලුමිනියම් බොයිලේරු | 06 යි |
| 06. | තනි යකඩ ඇඳන් | 04 යි |
| 07. | පීඩන ලාම්පු | 02 යි |
| 08. | වතුර පිල්ටර් | 07 යි |
| 09. | කල්දේරන් | 05 යි |
| 10. | පරණ විදුලි කේතල් | 18 යි |
| 11. | පරණ මේස විදුලි පංකා | 19 යි |
| 12. | කැසට් රෙකෝඩර් (නැෂනල් –අංකය අපැහැදිලි රේඩියෝ) | 06 යි |
| 13. | වානේ අල්මාරි | 02 යි |
| 14. | වානේ කැබිනට් | 03 යි |
| 15. | පරණ පොටෝ කොපි යන්ත්‍ර (කැනන් සීඑන්එප් 122900) | 01 යි |
| 16. | ලූකස් බැටරි (ඇම්පියර් 12) | 01 යි |
| 17 | .සිංහල යතුරු ලියන | |
| | i. ගොඩ්රිච් 934176/01 | 04යි |
| | ii. පැසික් 875731/01 | |
| | iii. පැසික් 954143 | |
| | iv. අංකය හා වර්ගය අපැහැදිලියි | |
| 18. | ඉංග්‍රීසි යතුරු ලියන | 02 යි |
| | i. පැසික් අංක 659888/01 | |
| | ii. ප්‍රීමා අංක 734023 | |
| 19. | පරණ රූපවාහිනී යන්ත්‍ර | 04 යි |
| | i. අංකය ඇපැහැදිලි ඩබ්. ඊ. සී. වර්ගය | |
| | ii. ටී. වී. සෝනි 295185 | |
| | iii. ටී.වී. සෝනි අංකය නැත | |
| | iv. ටී.වී. සැම්සුන් අංකය නොමැත | |
| 20. | පරණ පාපැදි | 05 යි |
| | i. එවොන් 12706762 | |
| | ii. එවෝන් 1222632 | |
| | iii. වර්ගය අපැහැදිලිය. අංකය 12596155 | |
| | iv. හීරෝ අංකය 5517353 | |
| | v. එවෝන් අංකය 12592530 | |
| 21. | විදුලි පංකා (ස්ටෑන්ඩ්) | 01 යි |
| 22. | කියත් තල (බන්ඩ් කියත්) | 08 යි |
| 23. | ටෙලිපෝන් එක්ස්චේන්ජ් | 01 යි |
| 24. | වතුර මෝටර් | 02 යි |
| | i. වී/07/8 ජිනසේන | 01 යි |
| | ii. සෙන්ට්‍රික් අංකය අපැහැදිලි | |
| 25. | හැලජන් ලාම්පු | 03 යි |
| 26. | ගෑස් ලාම්පු | 01 යි |
| 27. | ඇලුමිනියම් තල | 01 යි |
| 28. | පොරව | 04 යි |
| 29. | හිරමන | 02 යි |
| 30. | විල්බැරෝ | 01 යි |
| 31. | කැති | 02 යි |
| 32. | ගෑස් කුකර් (බර්නර්) | 01 යි |
| 33. | ඇලුමිනියම් ජෝගු | 03 යි |
| 34. | නාරාසන | 01 යි |
| 35. | මෙටල් ට්‍රේ | 02 යි |
| 36. | ගැල්වනයිස් බාල්දි | 10 යි |
| 37. | යකඩ පුටු | 13 යි |
| 38. | ගැල්වනයිස් පුටු | 04 යි |
| 39. | පුටු | 12 යි |
| 40. | මේස පිහි | 09 යි |
| 41. | අත් කියත් | 01 යි |
| 42. | පරණ උදලු තල | 05 යි |
| 43. | මන්න පිහි | 07 යි |
| 44. | ඇලුමිනියම් කේතල | 02 යි |
| 45. | පරණ සාස්පාන් | 14 යි |
| 46. | පැට් ලොක් | 06 යි |
| 47. | පරණ පිහි | 04 යි |
| 48. | අඩු සහිත සාස් පාන් | 02 යි |
| 49. | යකඩ කම්බි | 01 යි |
| 50. | ටී. අයි. ටී. යුඑස් වතුර පිල්ටර් | 02 යි |
| 51. | පොත් රාක්ක | 01 යි |
| 52. | ලී අල්මාරි | 02 යි |
| 53. | බෙස් පැට් ලොක් | 01 යි |
| 54. | පොල් උල් | 02 යි |
| 55. | ඉබි යතුරු | 13 යි |
| 56. | මේස ඇඳි | 17 යි |
| 57. | ලී මේස | 02 යි |
| 58. | සාස්පාන් ලොකු | 03 යි |
| 59. | යකඩ ඇඳන් යුගල | 03 යි |

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී,
මීගමුව.

පොලිස් අධිකාරී කාර්යාලය,
මීගමුව.
2007.01.18.

02-632

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

කොළඹ 12, මැසෙන්ජර් වීදිය, අංක 39 හි දැනට පදිංචි අමිනා කාසිම් අල්ලාරක්කා මහත්මිය විසින් කොළඹ 12, මැසෙන්ජර් වීදියේ, අංක 39 හි, පදිංචි මොහමඩ් සිරාජ් කාසිම් සිය ඇටර්නි බලකරු ලෙස පත් කරමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ගංගාධරන් මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 5629 සහ 2003.10.20 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබේ.

තවද මින් ඉදිරියට එකී ඇටර්නි බලපත්‍රය යටතේ ඔහු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා වගනොකියන බව ද නිවේදනය කරමි.

ඒ. කිව්. අල්ලාරක්කා.

02-618

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ඕමාන් රජයේ, සීබ්, සී. පී. ඕ. හා තැ. පෙ. අංක 1052, මෝඩ්ස් වුඩුම් නවාල් බේස් හි හා බොරලැස්ගමුව, කටුවාවල, අංක 90/3 හි පදිංචි විජය බන්දුල කොතලාවල වන මා විසින් ඕමාන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ දෙවන ලේකම් ඩබ්. ඒ. ප්‍රේමරත්න මහතා විසින් සහතික කරන ලද 1993.10.02 වන දින දරන ඇටර්නි බලපත්‍රය මගින් කටුවාවල, බොරලැස්ගමුව, අංක 90/2 දරන ස්ථානයේ පදිංචි වීරමංගල කොතලාවල යන අයට පවරන ලද ඇටෝර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරනු ලබන අතර, ඇටර්නි බලපත්‍ර පොතේ පිටු 143/112 හා දිනපොත් අංක. 8410 හා 1993 නොවැම්බර් මස 19 වැනි දින ලියාපදිංචි කරන ලද ඉහත කී විදේශ ඇටර්නි බලපත්‍රය වර්ෂ 2007 ක්වූ ජනවාරි මස 25 වන දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට එකී ඇටර්නි බලකරු වීරමංගල කොතලාවල විසින් මින් ඉදිරියට මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් කරනු ලබන කිසිම කටයුත්තකට මා විසින් වගකියනු නොලැබෙන පරිදි අහෝසිකොට අවලංගු කර සිටින බව ශ්‍රී ලංකාවාසී ජනතාවටත්, ශ්‍රී ලංකා ජනරජයටත් මෙයින් දන්වා සිටිමි.

වර්ෂ 2007 ක් වූ ජනවාරි මස 02 වන දින දී ය.

විජය බන්දුල කොතලාවල.

02-625

## ඇටර්නි බලපත්‍රය අහෝසි කිරීම

මීගමුව, තලාදූව, අංක 159 හි පදිංචි වර්ණකුලසූරිය සුනිල් වික්ටර් ප්‍රනාන්දු වන (ජා. හැ. අ. 591670166 V) හිමි මම කොච්චිකඩේ පල්ලන්සේන පදිංචි ඩග්ලස් අමරසිංහ ප්‍රසිද්ධ නොතාරිස් 1997.09.26 දින ලියා සහතික කළ අංක 1460 දරන ඇටර්නි බලපත්‍රය මගින් මීගමුව, තලාදූව, අංක 159 හි පදිංචි මහතෙල්ගේ ටියුඩර් බෙනඩික් පීරිස් යන අය මාගේ ඇටර්නි බලකරු ලෙස පත්කළ අතර, එකී පත් කිරීම මා මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

වර්ණකුලසූරිය සුනිල් වික්ටර් ප්‍රනාන්දු

02-631

## විදේශීය ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඇමරිකාවේ අංක 2339, බෙඩ්ෆඩ්ෂයර් සර්කල්, රෙස්ටන් වර්ජිනියා පදිංචි චූලා නන්දනී ශ්‍රියානි ගුණසේකර සහ ජයසිංහගේ දොන් හේමචන්ද්‍ර ගුණසේකර යන අප විසින් දෙන ලද මයිකල් හෙන්ලේ, ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2006.10.03 සහතික කරන ලද අංක 78, 3 වන පටුමග, අභය පෙදෙස, අනුරාධපුරය පදිංචි කඹුරුගමුව ලොකු ආචාරිගේ මෛත්‍රීපාලට දෙන ලද විදේශීය ඇටර්නි බලපත්‍රය 31.01.2007 සිට අවලංගු කරල ලදී.

මෙම දැන්වීම පලවූ දින සිට සිදුකරන කිසිම ගනුදෙනුවක් සම්බන්ධව අප මින් ඉදිරියට වග කියනු නොලැබේ.

චූලා නන්දනී ශ්‍රියානි ගුණසේකර
ජයසිංහගේ දොන් හේමචන්ද්‍ර ගුණසේකර.

02-633

## ඇටර්නි බලය අවලංගු කිරීමයි

පහත අත්සන් කරන අංක සී/1/6, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, කොළඹ 02 දරන ස්ථානයේ පදිංචි පන්විල මනන්නලාගේ සෝමවතී (ජා.හැ.අංක 385020341V) වන මා විසින් නො. C/G/4, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, කොළඹ 02 දරන ස්ථානයේ පදිංචි කහවෙ පල්ලියගුරුගේ මනෝරි ශ්‍යාමා විජේවර්ධන (ජා.හැ.අං 656410280V) යන අය වෙත ප්‍රදානය කරන ලද කොළඹ මහාධිකරණ කලාපයේ ප්‍රසිද්ධ නොතාරිස් මංජුලා ශ්‍රීමතී ගනේෂන් විසින් වර්ෂ 2005ක් වූ අගෝස්තු මස 05 වැනි දින සහතික කරන ලද අංක 4234 දරන ඇටර්නි බලපත්‍රය වහාම ක්‍රියාත්මක වන පරිදි ප්‍රසිද්ධ කොට අවලංගු කරන ලද බවත් එකී කහවෙ පල්ලියගුරුගේ මනෝරි ශ්‍යාමා විජේවර්ධන යන අය මාගේ ඇටර්නි බලකරු වශයෙන් තවදුරටත් ක්‍රියා නොකරන බවත් මෙතැන් පටන් ඇය විසින් එළඹෙන කවර හෝ ගණුදෙනුවකට මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ආණ්ඩුවටත් මහ ජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

පන්විල මනන්නලාගේ සෝමවතී

2007.02.06

02-654

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

LE/RE/208.

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 2000000315.
ණයකරුගේ සම්පූර්ණ නම : ලොරෙන්සු හේවගේ රවින් කුමාර.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2006.08.25 වන දින අංක 1459 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2007.01.08 වන දින "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල ද, වර්ෂ 2007.01.09 වැනි දින ලක්බිම පුවත්පතේ ද පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, කුරුණෑගල, කුමාරතුංග මාවත, නව කාර්යාල සංකීර්ණය, අංක 28 යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර වන ඩබ්ලිව්. එම්. අයි. ගල්ලැල්ල මයා විසින් 2007.03.16 වන දින ප. ව. 02.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හැටහතර දහස් අටසිය තිස් පහයි ශත අනූහයක (රු. 1,64,835.96) මුදලක් වර්ෂ 2005.01.31 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති බැවින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ හතලිස් දෙදහස් පන්සිය හැටයි ශත හතලිස් හයක (රු. 1,42,560.46) මුදල ද, 2005.01.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් විසිදෙදහස් දෙසීය හැත්තෑ පහයි ශත පනහක් (රු. 22,275.50) වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ හැටහතර දහස් අටසිය තිස් පහයි ශත අනූහයක (රු. 1,64,835.96) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ හතලිස් දෙදහස් පන්සිය හැටයි ශත හතලිස් හයක (රු. 1,42,560.60) මුදල මත අයවිය යුතු වර්ෂයකට 14.90% බැගින් වන පොළියක් 2005.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කාලගම් පත්තුවේ, මාමිනිය කෝරලේ, කැකිරාව කරුක්කන්කුලම තුලාන ප්‍රාදේශීය සභා සීමාවේ, පනික්කන්කුලම ග්‍රාමයෙහි පිහිටි ගොඩඉඩම නමැති ඉඩමට 2001.01.22 දින ඩබ්. ඩී. දසනායක මානක තැන විසින් මැන සම්පාදිත අංක 5002 පිඹුර ප්‍රකාර ලොට් 01ට මායිම්, උතුරට: ජයවංශගේ ඉඩම ද ; නැගෙනහිරට : ටී. එන්. පී. සෙනෙවිරත්නගේ ඉඩම ද ; දකුණට : මෛත්‍රීපාලගේ ඉඩම ද ; බටහිරට: ටැංකියේ සිට ප්‍රධාන පාරට ඇති පාර යන මායිම් තුළ පිහිටි රූඩ් එකක (අ. 0, රූ. 1, පර්. 0) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමඟ අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්ඩීඕ 318/213හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2007ක් වූ පෙබරවාරි මස 9 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

02-743

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 1800000941.
ණයකරුගේ සම්පූර්ණ නම : කරුණාතිලකගේ නිමල් වීරසූරිය.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2005.12.23 වන දින අංක 1425 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2006.04.08 වන දින "ලක්බිම", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, කුරුණෑගල, කුමාරතුංග මාවත, නව කාර්යාල සංකීර්ණය, අංක 28 යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර වන ඩබ්ලිව්. එම්. අයි. ගල්ලැල්ල මයා විසින් 2007.03.15 වැනි දින පෙ. ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හතලිස් තුන්දහස් හත්සිය අනූදෙකයි ශත අසූහයක් (රු. 1,43,792.86) මුදලක් වර්ෂ 2003.07.31 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති බැවින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ විසිඑක් දහස් එකසිය විසි තුනයි ශත අසූ හතරක් (රු. 1,21,123.84) මුදල ද, 2003.07.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් විසිදෙදහස් හයසිය හැට නමයයි ශත දෙකක් (රු. 22,669.02) වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ හතලිස් තුන්දහස් හත්සිය අනූදෙකයි ශත අසූහයක් (රු. 1,43,792.86) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ විසිඑක් දහස් එකසිය විසි තුනයි ශත අසූ හතරක් (රු. 1,21,123.84) මුදල මත අයවිය යුතු වර්ෂයකට 13.50% බැගින් වන පොලියක් 2003.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම පිණිස.

### දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හිරියාල හත්පත්තුවේ, මහගල්බොඩ එගොඩ කෝරළේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ, ගලගෙදර ග්‍රාමයෙහි පිහිටි කජුගහමුලවත්ත නමැති ඉඩමට 1999.11.01 වැනි දින ජී. බී. දිසානායක මානක තැන විසින් නැවත මනින ලද 1977.01.12 දින එච්. බී. අබේරත්න මානක තැන විසින් සම්පාදිත අංක 1321 පිඹුර ප්‍රකාර ලොට්: 01 ඒ 01ට මායිම්, උතුරට: මාර්ග රක්ෂිතය ද ; නැගෙනහිරට : අංක 1321 පිඹුරේ ලොට් 2 ද ; දකුණට : ලොට් 01 ඒ 2 ද ; බටහිරට: ගම් සහා පාර යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකක් (අ. 0, රූ. 2, පර්. 0) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමඟ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 755/213 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2007ක් වූ පෙබරවාරි මස 9 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

02-745

---

### මහජන බැංකුව – ගල්නෑව ශාඛාව

මහවැලි "එච්" කලාපයට අයත් බුල්නෑව නගරයේ කලාවැව, තඹුත්තේගම ජය මාවත ප්‍රධාන මාර්ගයට මුහුණලා පාරේ දකුණු පස පිහිටි අක්. 01, රූඩ් 3, පර්. 27 (හෙක්ටයාර් 0.778 ක්) හා පර්චස් 14 (හෙක්ටයාර් 0.036ක්) විශාල ඉඩම් කොටස් දෙකෙහි බදු අයිතිය සහ එහි තුළ පිහිටි සියලු පහසුකම් වලින් සමන්විත වී මෝල් ව්‍යාපෘතිය හා එහි යන්ත්‍රෝපකරණ මහජන බැංකුවෙන් අප වෙත පවරා ඇති බලතල මත 2007.03.06 වැනි දින පෙ. ව. 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේදී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩි විස්තර සඳහා.–* 1999.12.10 දින *රජයේ ගැසට් පත්‍රයේ* හා 1999.12.08 දින " ඩේලි නිව්ස්" 1999.12.06 දින "දිනමිණ" සහ "තිනකරන් " පුවත්පත් බලන්න.

*දේපළට ළඟාවීම.–* ගල්නෑව ජය මාවතේ කි. මී. 2.5 ක් පමණ දුරින් බුල්නෑව නගර ආසන්නයේ ප්‍රධාන මාර්ගයේ දකුණු පස මහා මාර්ගයට යාබදව දේපළට බාධාවකින් තොරව ප්‍රවේශ විය හැක. .

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය සිදු කළ විගස ගැණුම්කරු විසින් ගැණුම් මිලෙන් 25% ක් ද, ප්‍රාදේශීය සභා බදු වශයෙන් 1% ක් ද, වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද, වෙනත් ගාස්තු වෙතොත් ඒ සෑම ගාස්තුවක් ම මුදලින් ගෙවිය යුතුය. ගැණුම් මිලෙන් ඉතිරිය 75% ක් වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත මහජන බැංකුව- ගල්නෑව ශාඛාවේ තැන්පත් කළ යුතුය.

බදු හිමිකම් සඳහා හා වැඩිමනත් විස්තර සඳහා මහජන බැංකුව - අනුරාධපුර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයෙන් විමසන්න.

දුරකතන අංක : 025-2222593, 025- 2223035, 025-2222500, 025-2235855.

ෂොක්මන් සහ සමරවික්‍රම,
මහජන බැංකුවේ සහ වෙනත් බැංකු
සඳහා පිළිගත් පුරෝගාමී වරලත්
වෙන්දේසිකරුවන් සහ තක්සේරුකරුවන්.

*ප්‍රධාන කාර්යාලය* :
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකතන අංක : 081-2224371, 081-2227593.
ෆැක්ස් අංකය : 081-2224371.
ඊමේල් : samera@diamond.lanka.net

02-741

---

### සීමාසහිත සෙලාන් බැංකුව - වැලිමඩ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීමයි.

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ කොට්ඨාසයේ ඌව පළාත කෝරළේ නුගතලාව ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. ඩී. ඩබ්ලිව්. වෙල්ගොල්ල විසින් සාදන ලද 1956.05.06 දිනැති අංක 1052 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන වැමුල්ල වත්ත සහ උඩුමුල්ල වත්ත *හෙවත්* උඩුමුල්ලේ හේන නැමැති ඉඩමෙන් කැබැලි අංක 1 ලෙස පෙන්නුම් කරන ඉඩම් කොටස ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් තුනයි පර්චස් විස්සක් (අ. 1, රූ. 3, පර්. 20) විශාල ඉඩම. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 311/166 යටතේ ලියාපදිංචි කර ඇත.

පෙර කී නුගතලාව ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. රත්නායක විසින් සාදන ලද 1994.01.03 දිනැති අංක 556 දරන සැලැස්මේ සඳහන් වාමුල්ල වත්ත සහ උඩුමුල්ල වත්ත නැමැති ඉඩමේ කැබලි අංක 1 ලෙස පෙන්නුම් කරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් තිස් එකයි දශම දෙකක් (අ. 1, රූ. 2, පර්. 31.2)විශාල එකී සැලැස්මේ කැබැලි අංක 2 සේ පෙන්වනු ලබන මාර්ග ප්‍රවේශය පාවිච්චි කිරීමේ අයිතිය සමග ඉඩම. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 515/24 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙම දේපළ වැලිමඩ පදිංචි කුතයියා වේලායුදම් සහ සින්නප්පන් සුන්දරාජ් යන අය බන්ධනදායී වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත. එකී කුතයියා වේලායුදම් යන අය ඉන්දුමතී වේලායුදම්, වේලායුදම් ත්‍යාගරාදයින්, වේලායුම්

නන්දනී සහ වේලායුදම් කමලාරූබන් යන අය නීත්‍යානුකූල උරුමක්කරුවන් වශයෙන් දේපළ වෙනුවෙන් අන්තිම කැමති පත්‍රයක් නොලියා 1996 මාර්තු 27 වන දින මියගිය හෙයින් ද ඔවුන් විසින් ඒ අනුව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 7(2) දරන වගන්තිය යටතේ බණ්ඩාරවෙල දිසා අධිකරණයේ අංක බී/ප්‍රෙබේට්/10 දරන මුදල් නඩුවෙන් ප්‍රොබේට් බලපත්‍රය ලබා ඇත.

යෝජනා සම්මුති දැන්වීම 2006.11.24 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේද* 2006.09.29 වන දින ඩේලිමිරර් සහ ලංකාදීප පුවත්පත් වලද 2006.10.03 වැනි දින වීරකේසරි පුවත්පතේද පළ වී ඇත. ඉහත සඳහන් දේපළ 2007 මාර්තු මස 15 වැනි දින පෙරවරු 11.00 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.*– වැලිමඩ නගරයේ සිට නුවරඑළිය මාර්ගයේ කි. මී. 2 ක් පමණ ඉදිරියට ගිය විට හමු වන සාප්පුකඩේ මංසන්ධියෙන් දකුණු පසට ඇති වැලිමඩගම මාර්ගයට හැරී මීටර් 300 ක් පමණ ඉදිරියට ගිය විට වම්පසට ඇති රථවාහන ගමන් කළ හැකි බොරළු පාරට හැරී තවත් මීටර් 300 ක් ඉදිරියට ගොස් වම්පසට ඇති වතුයායට පිවිසෙන මාර්ගයේ මීටර් 400 ක් පමණ ගිය විට නැවතත් වම්පසට ඇති බොරළු පාරට හැරී මීටර් 100 ක් පමණ ඉදිරියට ගිය විට අදාල දේපළට පිවිසිය හැක.

*ගෙවීමේ ක්‍රමය.*–සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුය.

1. ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්) 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැනුම් මිලෙන් 1% ක් වන පළාත් අධිකාරි බද්ද (සියයට එකක්) 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්) 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500 6. සියළුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිම කල යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරි (නීති), සීමාසහිත සෙලාන් බැංකුව, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක : 011-2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස් තක්සේරුකරු.

ටී. ඇන් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක : 011-2696155, 011-2572940

02-736

---

## වයඹ සංවර්ධන බැංකුව –මාවරමණ්ඩිය ශාඛාව

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ සූරියපාලුව පිහිටි දෙල්ගහ වත්ත නැමැති ඉඩමේ ලොට් A දරන කොටසට අයත් පර්චස් 24.91 ක් *හෙවත්* හෙක්ටයාර් 0.0630 ක් විශාල ඉඩම සහ ඊට අයිති සියලු දේද මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 560/227 සහ 228 හි ලියාපදිංචි වී ඇත.

වයඹ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත 2007 මාර්තු 16 වන දින, පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ මවිසින් විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2006.05.11, දින *රජයේ ගැසට් පත්‍රයද*, 2006.07.20 වන දින දිනමිණ, තිනකරන්, ද අයිලන්ඩ් යන පුවත්පත් බලන්න.

*දේපළට ළඟාවීම.*– කිරිල්ලවල මහර ප්‍රාදේශීය ලේකම් හන්දියෙන් නුවර පාරේ වමට හැරී කිලෝමීටර් 2 ක් පමණ ගොස් සූරියපාලුව පාරේ සූරියපාලුව කණිෂ්ඨ විද්‍යාලය දක්වා ගොස් ඉන් පසු දකුණට හැරී ඇල්හේන වත්ත පාරේ මීටර් 400 ක් ගොස් හමුවන අඩි 10 පළල් පාරේ මීටර් 18 ක් ගිය විට දකුණු පසින් මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් මෙහි පහත සඳහන් මුදල් ප්‍රමාණයන් මුදලින් ගෙවිය යුතුය.

(1) ගැණුම් මිලෙන් 25%,
(2) වෙන්දේසිකරුගේ කොමිස් ගාස්තු 2.5% ක්,
(3) රජයට ගෙවිය යුතු බද්ද 1% ක්,
(4) වෙන්දේසිය සඳහා වැයවූ අනෙකුත් ගාස්තු ද,
(5) විකුණුම් සහිතකය සඳහා මුද්දර ගාස්තු ද.

ගැණුම් මිලෙන් ඉතිරි 75% ක මුදල වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත වයඹ සංවර්ධන බැංකුව, අංක 155, මීගමු පාර, කුරුණෑගල වෙත ගෙවිය යුතුය.

වැඩි විස්තර සඳහා විමසන්න, වයඹ සංවර්ධන බැංකුව, අංක 155, මීගමු පාර, කුරුණෑගල.

දුරකතන අංක : 037-2227425, 2227427.

ඩබ්. පී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්.

අංක 22, ප්‍රනාන්දු මාවත,
මීගමුව.

02-772

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - බදුල්ල ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පනවනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. පී. ආනන්ද විසින් සහිතක කරන ලද්දාවූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූද 2003.01.22 දින සහ අංක 9418 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දේවානැන්හලාගේ සනත් ධර්මසේන ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්,

සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර පහත සඳහන් දේපළ පිහිටි ස්ථානයේදී 2007 මාර්තු මස 12 වන දින ප. ව. 3.00 සිට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ, උඩුකින්ද කොට්ඨාසයේ, උඩපළාත කෝරළේ ගොරන්දිඇල්ල ගමේ පිහිටි ඇන්තිස් ලැන්ඩ් නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ඩබ්ලිව් එස්. එස්. පෙරේරා විසින් 1998.05.25 වන දින මැන සාදන ලද අංක 3787 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 11 දරන ඉඩම වේ.

විශාලත්වය : පර්චස් 14.50

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2006.12.29 දින *රජයේ ගැසට් පත්‍රය* සහ 2007.01.17 වන දින ද, අයිලන්ඩ්, දිවයින, සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකහමාරක් (2. 1/2%) ක් ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500) ක් ද,
5. සියළුම ප්‍රචාරක වියදම්,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහ (රු. 2000) ක් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10% අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු සහ අදාළ ලියවිලි පරීක්ෂා සහ වෙනත් තොරතුරු සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, බදුල්ල ශාඛාව (දුරකථන අංක. 055-4499701 055-2222991) හෝ කොළඹ 10 ටී. බී. ජයා මාවත අංක 479 ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන කළමනාකරු (ණය අයකිරීම්) දුරකථන අංක: 2661815, 2661816 ගෙන් ලබා ගත හැක.

එන්. එච්. පී. එෆ්. ආරියරත්න,
උසාවි කොමසාරිස් හා බලයලත් වෙන්දේසිකරු.

අංක 34/31 සහ 32,
නීතිඥ කාර්යාල සංකීර්ණය, කොළඹ 12.

02-733

---

## සීමාසහිත සෙලාන් බැංකුව - ඇඹිලිපිටිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න කෝරළේ දියපොතගම් පත්තුවේ පල්ලේගම ගමේ ඇඹිලිපිටිය පිහිටි 1996.11.10 දිනැති අංක 7525 දරන ඔප්පුවේ සඳහන් සහ 1996.11.07 දිනැති අංක 1014 දරන සැලැස්මේ සඳහන් සහ එප්. වී. පී. 779 හි සඳහන් කැබැලි අංක 227 හි කොටසක් ලෙස පෙන්නුම් කරනු ලබන ගිරුවායේ ගෙදරවත්ත නැමති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස තුළ පර්චස් දෙකයි දශම එකයි හතරක් (අ. 0, රූ. 0, පර්. 02.14)ක් විශාල ගොඩනැගිලි වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම (මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත් ඉරුව ජී 165/94 යටතේ ලියාපදිංචි කර ඇත.

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න කෝරළේ දියපොතගම් පත්තුවේ පල්ලේගම ගමේ ඇඹිලිපිටිය පිහිටි 1996.11.10 දිනැති අංක 7525 දරන ඔප්පුවේ සඳහන් සහ 1996.11.07 දිනැති අංක 1015 දරන සැලැස්මේ සඳහන් සහ එප්. වී. පී. 779 හි සඳහන් කැබලි අංක 227 හි කොටසක් ලෙස පෙන්නුම් කරනු ලබන ගිරුවායේගෙදරවත්ත නැමති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස තුළ පර්චස් දෙකයි දශම එකයි හතරක් (අ. 0, රූ. 0, පර්. 2.14) විශාල ගොඩනැගිලි වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම (මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත් ඉරුව ජී 145/6, ජී 145/202 යටතේ ලියාපදිංචි කර ඇත.)

මෙම දේපළ ඇඹිලිපිටිය, නවනගර පාර, මයුර ටෙක්ස්ටයිල් හි විදාන ආරච්චිගේ සරත් කුමාර මහතා සහ දේශරංජනී දහනායක මහත්මිය යන අය බන්ධනදායී වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම 2005.08.12 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2005.06.08 වැනි දින දිනමිණ, ඩේලිනිව්ස්, සහ තිනකරන් යන පුවත්පත් වල ද පළ වී ඇත.

ඉහත සඳහන් දේපළ 2007 මාර්තු මස 22 වන දින පෙරවරු 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.*–ඇඹිලිපිටිය ඔරලෝසු කණුව හංදියේ සිට මීටර් 400 ක් නව නගරය පාරේ ඉදිරියට ගියවිට අදාල දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුවේ. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) පළාත් පාලන බදු සඳහා සියයට එකක් (1%) වෙන්දේසිකරුගේ කොමිස් මුදල සියයට දෙකහමාරක් (2 1/2%) නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීමේ ගාස්තු සඳහා රු. 2000 ක් ලිපිකරු හා සෝෂක වේතනය රු. 500 ක් සියලුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනුවක් (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළතදී සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිම කල යුතුයි.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකරු (නීති) සීමාසහිත සෙලාන් බැංකුව, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකතන අංක : 2456258, 2456263, 24562284.

තුසිත කරුණාරත්න (සා. වි.)
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොලොන්නාව,
දුරකථන අංක 2696155, 2572940

02-735

### ඩී. එෆ්. සී. සී. බැංකුව
(කලින් ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලද)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය

අගනා දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

10563 අංක දරන ඇපකරය යටතේ උකස් කරන ලද පහත විස්තර කර ඇති දේපලෙහි බදු අයිතිය :

මධ්‍යම පළාත, නැගෙනහිර මාතලේ දිස්ත්‍රික්කයේ අඹන්ගඟ කෝරළේ, ගම්මඩුව ග්‍රාමයේ පිහිටි ගම්මඩුව එස්ටේට් (වත්ත) යනුවෙන් හඳුන්වනු ලබන මිනින්දෝරු පී. එස්. එම්. එම්. පාදෙණිය මහතා විසින් සහතික කරන ලද 1997 දෙසැම්බර් 29 දින හා ප්ලෑන් අංක 68/97 දරන ඇපකරය යටතේ ගෙවීම් සිදු වී නොමැත. ඩී. එෆ්. සී. සී. බැංකුව විසින් අප වෙත පවරන ලද බලතල අනුව ලොට් අංක 1, 2, 3 සහ 4 යනුවෙන් නිරූපිත ඉඩම් කොටස.

එහි පිහිටි ගම්මඩුව එස්ටේට්වලට අයත් බංගලාව, ලයින් කාමර, කාර්යාල, බර කිරන කාමර සහ අනෙකුත් ගොඩනැගිලි, ගස්කොළන්, වැවිලි, ගොඩනැගිලි සහ අනෙකුත් සියළු දේ සමග මොරටුව ලියාපදිංචි කාර්යාලය පිහිටි ගම්මඩුව ප්ලාන්ටේෂන්ස් (පුද්ගලික) සමාගම විසින් ඩී. එෆ්. සී. සී. බැංකුවට උකස් කරන ලද අංක 10563 දරන ඉඩම 2004 ඔක්තෝබර් මස 12 වන දින ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. පී. ආනන්ද මහතා විසින් සහතික කළ උකස් ඔප්පුව මත, ලොට් අංක 1, 2 සහ 3 - හෙක්ටයාර් 205.3296 සහ ලොට් අංක 4 - හෙක්ටයාර් 45.4548, 2007 මාර්තු මස 14 වැනි බදාදා පෙ.ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය* :- මිල තීන්දු වනවාත් සමගම, සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් වටිනාකම් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක් වන විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක් පමණයි),
4. රු. 22,500 නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50% ක්,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500 යි,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000 යි,
7. විකිණීමේ ගාස්තු සහ වෙනත් ගාස්තු ඇත්නම්.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හා වෙනත් අධිකාරියක් මගින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, අය බදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද, සමග අදාල පරිදි වෙන්දේසි දින සිට දින 30ක් ඇතුලත ගෙවිය යුතුය.

වැඩිදුර විස්තර සඳහා කරුණාකර ඩී. එෆ්. සී. සී. බැංකුවේ නීති දෙපාර්තමේන්තුව වෙතින් විමසන්න.

දුරකථන අංක : 011-2440366.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී, වරලත්
වෙන්දේසිකරුවෝ සහ තක්සේරුකරුවෝ.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක: 081- 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371

*නගර කාර්යාලය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් : 011-2588146
ඊ-මේල් : samera@sri.lanka.net.

02-738

---

### සීමාසහිත සෙලාන් බැංකුව – ෆොරින් කරන්සි බැන්කින් යුනිට්

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 4 වන වගන්තිය යටතේ විකිණීම

මෙම දේපල 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගමක් වන නාත්තන්ඩිය හි පැරාමින්ස් (ප්‍රයිවේට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

1 වැනි උපලේඛනය

වයඹ පළාතේ, මාරවිල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල කෝරළේ, මැද පළාතේ, කොත්තරමුල්ල පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඒ. ජේ. වී. පෙරේරා විසින් සහතික කරන ලද 1975 සැප්තැම්බර් මස 4 දිනැති අංක 3418 දරන සැලැස්මේ සඳහන් තුම්මෝදරවත්ත නමැති ඉඩමේ " වයි" ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස අක්කර නවයයි, රූඩ් තුනයි, පර්චස් විසිහයක් (අ. 9 රූ. 3 පර්. 26) විශාල ගොඩනැගිලි, සවිකරන ලද යන්ත්‍ර සූත්‍ර, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය මාරවිල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ජේ. 50/06 යටතේ ලියාපදිංචි කර ඇත. මෑතක මැනීමේ දී එහි වයි කැබැල්ල පහත සඳහන් පරිදි විස්තර කර ඇත. වයඹ පළාතේ මාරවිල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ පුත්තලම දිස්ත්‍රික්කයේ දකුණු පිටිගල කෝරළේ මැද පළාතේ පහළ කොත්තරමුල්ල පිහිටි බලයලත් මිනින්දෝරු එච්. එස්. එස්. පෙරේරා විසින් සාදන ලද 1997 අප්‍රේල් මස 22 දිනැති අංක 3456 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන එකී අංක 3518 දරන සැලැස්මේ සඳහන් තුම්මෝදරවත්ත නමැති ඉඩමේ වයි කැබැල්ලේ නැවත මැනීමක් වන ඉඩම් කොටස අක්කර නවයයි, රූඩ් තුනයි, පර්චස් විසිහයක් (අ. 9 රූ. 3 පර්. 26) විශාල ගොඩනැගිලි, සවිකරන ලද යන්ත්‍ර සූත්‍ර, වගා සහ එහි පිහිටි සියළු දේ සමග ඉඩම.

## 2 වැනි උපලේඛනය

පහත සඳහන් කර ඇති සියලු සහ එක් එක් නිශ්චල යාන්ත්‍රික කට්ටල සහ උපකරණ :

| අංක | අයිතම | ප්‍රමාණය | විස්තරය |
|---|---|---|---|
| 01 | ජෝ ක්‍රෂර් | 1 | මොඩ්ල් : ජෙසී - 2 |
| 02 | බෙල්ට් කන්වෙයර් | 1 | මොඩ්ල් :බීසී - 350 -05 |
| 03 | රෝලර් ක්‍රෂර් | 1 | මොඩ්ල් :ආර් සී 2-250 |
| 04 | බෙල්ට් කන්වෙයර් | 1 | මොඩ්ල් :බීඑම් - 2,000 (ආර්) |
| 05 | ටොන් 2 කේ බෝල් මිල් බොඩිය සඳහා | සෙට්ස් 2 | මොඩ්ල් :බීඑම් 2,000 (ආර්) |
| 06 | 500 කි ග්‍රෑම්ස් බෝල් මිල් ඔපදැමීම සඳහා | සෙට් 1 | මොඩ්ල් :බී එම් -500 (එස් |
| 07 | බර කිරන තරාදිය | සෙට් 1 | ධාරිතාව: 1000 කි. ග්‍රෑම්ස් |
| 08 | අඩුවේගී ඇජිටේටරය බොඩිය සඳහා | සෙට්ස් 1 | මොඩ්ල් :එල් එස් ඒ -5.0(එස්) ඇජිටේටිං ආර්පීඑම් 22-24**r. p. m** |
| 09 | එයාර් ඩයෆ්‍රම් පම්ප් | සෙට්ස් 2 | මොඩ්ල් :එස්බී 1-1/2**A** |
| 10 | ලෝ ස්පීඩ් ඇජිටේටර ඔප දැමීම සඳහා | සෙට්ස් 2 | මොඩ්ල් :එල් එස් ඒ - 3.0 |
| 11 | මෙම්බ්‍රේන් පම්ප් | සෙට් 1 | මොඩ්ල් :එච්එම්පී -3000 (එස්) ධාරිතාව: 3000 ලීටර්ස්/පැය |
| 12 | ෆිල්ටර් ප්‍රෙස් ප්‍රමිති උපාංග සමග | සෙට් 1 | මොඩ්ල් :**FPH** 700 -60 (**R**) |
| 13 | හයිඩ්‍රොලික් ප්‍රෙෂර් පම්ප් | සෙට් 1 | මොඩ්ල් :එච්පී - 200 |
| 14 | වයිබ්‍රේෂන් සිව් | සෙට් 2 | මොඩ්ල් :වීඑස්ජී 600 |
| 15 | මැග්නටික් ෆෙරෝ ෆිල්ටර්ස් | සෙට් 4 | මොඩ්ල් :ඩබ්ලිව් එෆ් -1000 |
| 16 | හයිස්පීඩ් ඇජිටේටර් සුඹුං සඳහා | සෙට් 1 | මොඩ්ල් :එච්ජ්එස් -10 ඇජිටේටිං RPM: rpm |
| 17 | එයාර් ඩයෆ්‍රම් පම්ප් | සෙට් 1 | මොඩ්ල් එස්බීඅයි - 1/2 **A** |
| 18 | බෝල් මිල් සඳහා පෙබල්ස් | 20000 Kgs | ද්‍රව්‍ය ෆ්ලින්ට් සයිසස් 3.5 **cm**, 3,500 **Kgs** 4-6**cm**. 11,000 **Kgs** 8-19**cm**, 5,500 **Kgs** |
| 19 | බොල් මිල් සඳහා පෙබල්ස් | 2300Kgs | ද්‍රව්‍යඃ හයි ඇලුමිනා |
| 20 | වැකුම් එක්ස්ලූඩර් | සෙට් 1 | මොඩ්ල් :වීර් -10 (එස්. එස්.) |
| 21 | ඔටෝමැටික් රෝලර් පිගරිං මැෂින් විවිධ සේවා | සෙට් 2 | මොඩ්ල් :එච්ආර්එම් - (එම්.එන්) වර්ගය : 2 හෙඩ් ටයිප් |
| 22 | ක්ලේ කටිං මැෂින් | සෙට් 2 | මොඩ්ල් :එච්සීසී - ඩී |
| 23 | ලෙදර් හාඩ් ඩ්‍රයර් | සෙට් 1 | මොඩ්ල් :ජීඑම්ඩී -7ජී**x2** රූම්ස් (රෝලර් මැෂින් දෙක සඳහා) |
| 24 | වයිට් ඩ්‍රයර් | සෙට් 1 | මොඩ්ල් :පීඑම්ඩී -7ජී **x** 2 රූම්ස් (රෝලර් මැෂින් දෙක සඳහා) |
| 25 | හිට් ජෙනරේටර්ස් | සෙට් 1 | මොඩ්ල් : එච්ජී - 200 පරිමාණය:w2000xL-2250xxH1820mm ධාරිතාවය: 200000කේ සීඑල්/ පැයකට: ඉන්ධන : LPG හෝ LNG උෂ්ණත්වය:සෙන්ට්‍රිග්‍රේඩ් 150 උපරිම |
| 26 | ස්ලිප් රොටර් - හැන්ඩ්ල් අටැච්ං සඳහා | සෙට් 1 | මොඩ්ල් : එස්ආර් – **E** |
| 27 | හයි ස්පීඩ් ඇජිටේටර් කාස්ටිං සිප් සඳහා බොඩි | සෙට් 1 | මොඩ්ල් :එච්ජ්එස් - 10 ඇජිටේටිං RPM:100 r.p.m. |
| 28 | වයිබ්‍රේෂන් සිව් | සෙට් 1 | මොඩ්ල් : වීඑස් -600 |
| 29 | මැග්නටික් ෆෙරෝ ෆිල්ටර | සෙට් 1 | මොඩ්ල් : ඩබ්ලිව් එෆ් -1000 |
| 30 | ලෝ ස්පීඩ් ඇජිටේටර් -කාස්ටිං සිප් සඳහා (බොඩි) | සෙට් 1 | මොඩ්ල් :එච්ජ්එස් - 50 ඇජිටේටිං RPM:22-23 r.p.m. |
| 31 | වැකුම් ඇජිටේටර් සහ ටැංකිය | සෙට් 1 | මොඩ්ල් : වීඒටී - 500 |
| 32 | වැකුම් ඇජිටේටර් සහ ටැංකිය සඳහා වැකුම් පොම්පය | සෙට් 1 | මොඩ්ල් : ඩබ්ලිව්එස්වීජී-9030 |
| 33 | සොලිඩ් ප්‍රෙෂර් කාස්ටිං ටේබල් | සෙට් 2 | මොඩ්ල් : පිසිටී - 6 එස් |
| 34 | ඩ්‍රේන් කාස්ටිං බොඩි සඳහා ඕවර් හෙඩ් ඇජිටේටර | සෙට් 1 | මොඩ්ල් : එල්එස්ජ් 2.0 (ඕ.එච්.) ඇජිටේටිං RPM:26 -28 r. p. m |
| 35 | ඩ්‍රයි රූම් සඳහා ඉන්සියුලේෂන් බෝඩ් | කෑලි 20 | ප්‍රමාණය: W 1, 100 x L2400xT 6mm. |
| 36 | එයාර් ඩයෆ්‍රම් පම්ප් | සෙට් 1 | මොඩ්ල් : එස්බීඅයි - 1/2” **A** |
| 37 | කාස්ටිං අංශය සඳහා පෝටර්ස් වීල් | සෙට් 6 | මොඩ්ල් : පීඩබ්ලිව් - 250 |
| 38 | පෝරණු | සෙට් 1 | උඳුනේ වර්ගය: ෂට්ල් ටයිප් (කීල්ස් කාර් ටයිප්) ප්‍රමිති උපාංග සමග මොඩ්ල් :ජීඑෆ් -10 |
| 39 | ඩීඩස්ටිං මැෂින් | සෙට් 1 | මොඩ්ල් :ඩීඑම් - 1 වී වර්ගය: වර්ටිකල් ටයිප් |
| 40 | ඩීඩස්ටිං මැෂින් | සෙට් 1 | මොඩ්ල් : ඩීඑම්2 වී වර්ගය: වර්ටිකල් ටයිප් |
| 41 | එයාර් කම්ප්‍රෙෂර් | සෙට් 1 | මොඩ්ල් :එන්එච් -20 |
| 42 | ස්ප්‍රේ බූත් සහ ඩෙකරේෂන් රේඛා සඳහා පොටර්ස් වීල් | සෙට් 19 | මොඩ්ල් :ජීඩබ්ලිව් - 250 පරිමාණ :0250xH200 mm. |
| 43 | ස්ටැන්ඩ්බයි ජෙනරේටර් 250KVA | සෙට් 1 | (200 KW Prime rated, 50 Hz, 1,500 RPM, 3 Phase, 400/230 Voltrs, 0.8) Power Factor - ‘Vega” |
| 44 | පෝරණු | සෙට් 1 | උඳුනේ වර්ගය: ෂට්ල් ටයිප් (කීල්න් කාර් ටයිප්) ප්‍රමිති උපාංග සමග මොඩ්ල්: ජීඑෆ් - 10 ධාරිතාව: 10.0 m3/charge |
| 45 | වර්ණක නිෂ්පාදනය සඳහා පොට් මිල් | සෙට් 1 | මොඩ්ල් : ජීඑම් - 4-4 (1) |
| 46 | මැනුවෙල් පුට් පොලිෂිං මැෂින් | සෙට් 2 | මොඩ්ල් :එම්එෆ්ජී - ජී ධාරිතාව: 400 -6 pcs. පැයකට |
| 47 | ජිජ්සන් වැකුම් ඇජිටේටර | සෙට් 1 | මොඩ්ල් : ජීවීජ් - 2 වර්ගය 2 වැකුම් ටැංක් ටයිප් |
| 48 | පොටර්ස් වීල් | සෙට් 10 | මොඩ්ල් : ජී ඩබ්ලිව් - 250 |
| 49 | පොට් මිල් | සෙට් 1 | මොඩ්ල් : ජීඑම් - 5 |
| 50 | ස්ටැන්ඩඩ් සිව් | සෙට් 1 | දැල් 4රේ සිට 325 දක්වා |

| *අංක* | *අයිතම* | *ප්‍රමාණය* | *විස්තරය* |
|---|---|---|---|
| 51 | වැකුම් එක්ස්ලූඩර් | සෙට් 1 | මොඩල් : වීර්-3 (එස්.එස්ඕ)<br>ධාරිතාව: 100-140kgs- පැයකට |
| 52 | ෆිල්ටර් ප්‍රෙස් W/මෙම්බ්‍රේන් පම්ප් | සෙට් 1 | මොඩ්ල් :FPM - 300<br>පරිමාණ :W700xL2940xH1300mm<br>වර්ගය:(මැනුවෙල් ටයිප් හයිඩ්‍රොලික් ප්‍රෙෂර්) |
| 53 | ස්ලීප් ස්ටර්ර (බිලංගර්ස්) | සෙට් 1 | මොඩ්ල් : එම්එස් - ජී<br>RPM:3000r.p.r.m/min<br>පවර් මෝටරය 1/20 HP |
| 54 | ඩොල් මිල් | සෙට් 1 | මොඩ්ල් : බීඑම් 100 (ආර්)<br>ධාරිතාව: 100 කි. ග්‍රෑ./චාජ් |
| 55 | සර්කියුලේෂන් අවන් | සෙට් 1 | මොඩ්ල් : ඕඩීඑස් - 3<br>උෂ්ණත්වය: උපරිම 350 සෙන්ට්‍රිගේඩ් |
| 56 | විදුලි උදුන | සෙට් 1 | මොඩ්ල් : ජී 5943<br>උෂ්ණත්වය: උපරිම 1300 සෙන්ට්‍රිග්‍රේඩ් |
| 57 | ඉන්ෆ්‍රේරටඩ් මොයිෂ්චර් ඩිටර්මිනේෂන් බැලන්ස් | සෙට් 1 | මොඩ්ල් :වයිඑල් - 1 ඒ<br>සාම්පල් වේට් : ග්‍රෑම්ස් 5 |

ඉහත සඳහන් දේපළ 2007 මාර්තු මස 13 වැනි දින පෙ. ව. 11.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුති දැන්වීම *රජයේ ගැසට් පත්‍රයේ* 2007.01.19 වන දින ද, ලංකාදීප සහ ඩේලිමිරර් යන පුවත්පත් වල 2007.01.04 වැනි දින ද, වීරකේසරී පත්‍රයේ 2007.01.10 වැනි දින ද පළ වී ඇත.

*ඉඩමට පිවිසීම.–* කොළඹ සිට දංකොටුවට යන මාර්ගයේ මීගමුව සහ කොච්චිකඩේ හරහා ගොස් දංකොටුව නාත්තන්ඩිය පාරේ. කි. මී. 15.15ක් ගිය විට කොත්තරමුල්ල මෙතෝදිස්ත පල්ලිය පසු වූ වහාම අදාළ දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.–* සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය. 1. ගැණුම් මිළෙන් 10%ක් (සියයට දහයක්) 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1%ක් වන පළාත් අධිකාරි බද්ද (සියයට එකක්) 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්) 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500. 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිළෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිම කළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරී (නීති), සීමාසහිත සෙලාන් බැංකුව, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක : 011-2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න, (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු.

ටී. ඇන්. එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොලොන්නාව.
දුරකථන අංක : 011-2696155, 011-2572940.

02-737